

## ⁂ සුදන ඇසුර ගෙනෙයි ඉසුර

බක් අමාවක පෝද ධර්ම දේශනාව යටතේ මිතුරු ඇසුර පිළිබඳ සැලකිමත් විය යුතු දහම් කරුණු කිහිපයකට අර්ථකථනයක්. නිවන් මග පමණක් නොව දිවි මග සාර්ථකත්වය සඳහා ද මිතුරු ඇසුර වැදගත් සාධකයක් වන ආකාරය මෙමගින් පැහැදිලි කැරේ.

## ⁂ වරදට හේතුව

– තලගුණේ නන්දරතන හිමි

අපරාධ පිළිබඳ මනෝ විද්‍යාත්මක හා සමාජ විද්‍යාත්මක කරුණු පිළිබඳ බෞද්ධ හේතු – ඵල දර්ශනයට අනුව සිදුකැරෙන තුලනාත්මක විග්‍රහයකි. අපරාධ කිරීමට පුද්ගලයා පොළඹවන සමාජ හා මානසික හේතු විවරණය කිරීමට දරන උත්සාහයකි.

## ⁂ භාවනාවෙන් තොරව සෝවාන් විය නොහැකිය.

– ආචාර්ය ධර්මසේන හෙට්ටිආරච්චි

නිවන් මගෙහි ස්ථිර වන බුද්ධි මට්ටමක් වශයෙන් සැලකෙන 'සෝවාන්' තත්ත්වය ලබා ගැනීමට – භාවනා කිරීම අවශ්‍යද යන මාතෘකාව යටතේ ලියැවුණු සංවාදශීලී අදහසක් ඇතුළත් ලිපියකි.

## ⁂ ඉනාමළුව ඉසිපතනාරාම බෞද්ධ මධ්‍යස්ථානය

– ජයරත්න සූරියගොඩ

'වෙහෙර විහාර' විශේෂාංගය යටතේ දඹුල්ල හබරණ මාර්ගයේ ඓතිහාසික සීගිරියට යොමුවන මංසන්ධිය කේන්ද්‍ර කොටගත් ඉනාමළුව ප්‍රදේශයේ පිහිටා ඇති විහාරස්ථානයක් පිළිබඳ තොරතුරු.

## ⁂ අභිධර්මය බුද්ධ භාෂිතයක්ද?

ධර්ම ගවේෂකයන්ගේ අවධානයට යොමුවූ අභිධර්ම පිටකය – සැබවින්ම බුද්ධ දේශනාවක්ද යන්න කලක සිට විද්වතුන් අතර කතාබහට ලක්වූ මාතෘකාවකි. මෙම ලිපිය ද ඒ පිළිබඳ සංවාදශීලී අදහස් ඇතුළත් විමර්ශනයකි.

## ⁂ සිත සනසන 'මාරුතය'

'ආනාපාන සති' නමින් ප්‍රකට බෞද්ධ භාවනා ක්‍රමය පිළිබඳ හැඳින්වීමක්ද, ඉන්දියාවේ දී සිදු කරන ලද ප්‍රායෝගික භාවනා පුහුණු වැඩ පිළිවෙළක් හා එහි ප්‍රතිඵල පිළිබඳ විස්තර ද මෙම ලිපියට ඇතුළත්ය.

## ⁂ සුභාරතී අසරණ සරණ මෙහෙවරෙන් බිඳක්

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව මගින් සිදුකරන පොදු ජන මෙහෙවරක්වූ සුභාරතී අසරණ සරණ සේවය මගින් ඉටුකරන ලද සමාජ සේවා රැසක් පිළිබඳ ඡායාරූප හා විස්තර.

## ⁂ ජේතවන ස්තූපයේ වැඩ නිම වෙයි

– සේනපුර ඩී. නිශ්ශංක විසිනි

ජේතවන ස්තූපයේ ප්‍රතිසංස්කරණ කටයුතු නිමවීම නිමිත්තෙන් එම ව්‍යාපෘතියට අදාළව මෙතෙක් සිදුකැරුණු කටයුතු පිළිබඳ තොරතුරු මෙම ලිපියෙන් දැක්වේ.

## ⁂ ගලේ කෙටූ රුවන් සලකුණු

සෙල්ලිපි මගින් හෙළිවන බෞද්ධ ශාසනික වැදගත් සිදුවීම්, බුදුදහම හා ශාසනික ව්‍යාප්තිය උදෙසා – සෙල්ලිපි මගින් සැලසී ඇති මෙහෙවර.

## ⁂ අනුරාධපුර සාම විහාරය

– සේනපුර නිශ්ශංක

අනුරාධපුර පිහිටි විහාරස්ථානයක් පිළිබඳ තොරතුරු. මෙම විහාරස්ථානය මගින් ඉටුවන ආගමික හා සමාජ සේවා කටයුතු රැසක් පිළිබඳ විස්තර මෙම ලිපියට ඇතුළත් වේ.

## ⁂ Majjhima Patipada - the path to enlightenment

*-by Aryadasa Ratnasinghe*